
# දොහොත් මුදුන් තබා වඳිමු කැළණි විහාරේ!

අද - 2012 දුරුතු පොහෝ දා

එදා - 1957 දුරුතු පොහෝ දා

දි හා බැලූ පමණින් සිත බැති වඩවන නොමිනී
මහා ඕසයකි දොවනා පව් මළ, දුක පැමිණී
අහා! නිවන එතනය බුදු පහස ලැබූ කැළණී
විහා රයට දොහොත නගමි හද උතුරණ පෙමිනී

## බුදු පා පහස ලත් කැලණිය

කැළණි විහාරයේ ඉහත පින්තූරය යුග දෙකකට අයත් පින්තූර කොටස් දෙකක් එකට ඈඳා නිර්මාණය කරන ලද එකකි. දකුණු පස සිටින්නේ දැනට වසර 50 කට ඉහත එනම් 1957 දුරුතු පෝයට කැළණි විහාරයට විත් වන්දනාමාන කරන සැදැහැවතුන් පිරිසකි. වම්පස ගිය සතියේ, එනම් මේ 2012 ලැබූ දුරුතු පෝයට කැළණි විහාරයට වන්දනාව පිණිස ආ තරුණ යුවලක් සහ ඔවුන්ගේ දරු දෙදෙනාද වෙති. කාලය කුමක් වුවද අතීත යේ සිටම කැළණි පන්සලට ලංකා ජනතාවගේ ඇති භක්තිය වැඩි වෙනවා මිස බිඳකුදු වෙනස් වී නොමැතිය.

ගම්පහ දිස්ත්‍රික්කයට අයත් කැළණි විහාරය කොළඹ සිට කිලෝමීටර් 10 ක් පමණ දුරින් පිහිටා තිබේ.

බුදුරජාණන් වහන්සේ බුද්ධත්වයෙන් අටවන වසරෙහි වෙසක් පුන් පොහෝ දින තෙවන වරට ලක්දිවට, කැළණියට වැඩම කළහ. එය සිදුවූයේ මණිඅක්ඛිත නා රජු නාගදීපයෙහිදී බුදුන්වහන්සේට කළ ආරාධනාවක් අනුව ය. නා රජු මණ්ඩපයක් කරවා මාහැඟි මැණික් පුටුවක්ද බුදුරදුන් සඳහා පිළියෙල කළහ. බුදුරජාණන් වහන්සේ වැඩහිඳ දන්වළඳා දහම් දෙසූ එම අගනා මැණික් පුටුව නිදන් කරවා චෛත්‍යයක් කරවන ලදී. එය වී ගොඩක හැඩයෙන් යුක්ත ය.

අනුරාධපුරයේ රජ කළ කනිට්ඨතිස්ස රජ, දඹදෙණියේ රජ කළ 2 වන පරාක්‍රමබාහු ආදී රජවරු කැළණි විහාර භූමියෙහි පස්මහල් ප්‍රාසාද හා පිළිමගෙවල් ද, හතරැස් විහාරමළුව ද තැනූහ. ජයවර්ධනපුරය කෝට්ටේ රාජධානිය වීමත් සමග කැළණිය නැවතත් ප්‍රධාන පූජණීය ස්ථානය බවට පත්විය. එතැන් පටන් එය හැඳින්වෙන්නට වූයේ කැළණි රජමහ විහාරය යනුවෙනි.

### කැළණි විහාරේ ගීතය

පදමාලාව - ධර්මසිරි ගමගේ
ගායනය - විශාරද අමරදේව

නිවන් පුරට මඟ පෙන්වන පහන් වැටක් සේ
මැණික් කොතින් අහස උසට බුදුරැස් විහිදේ
මුනි සිරිපා පහස ලැබූ හිමි වැඩි ගමනේ
දොහොත් මුදුන් තබා වඳිමු කැළණි විහාරේ

නා මෙනවිය පෙර කල හිඳ ලවැලි තලාවේ
තත් පිරි මැද ඇඟිලි තුඩින් මිණි වීණාවේ
අදත් ඇසේ එදා වැයූ බුදුගුණ ගීතේ
දොහොත් මුදුන් තබා වඳිමු කැළණි විහාරේ

සිහිල් සුළං වැදී සැලී බෝපත් නැළැවේ
පහන් හැඟුම් හදේ නැගේ මෙත් කරුණාවේ
වරක් ඇවිත් අප වැන්දොත් කැළණි විහාරේ
උපන් දා පටන් කළ හැම පව් දුරුවන්නේ

කැළණි විහාරයේ චිත්‍ර පහතරට චිත්‍ර සම්ප්‍රදායට අයත්ය. පැරණි විහාරගෙට යාබදව තනා ඇති අළුත් විහාර මන්දිරය දර්ශණීය කලාගාරයක් බඳුය. සෝලියස් මැන්දිස් නමැති කලාකරුවා නිමකළ එම චිත්‍ර ලෝක ප්‍රසිද්ධය. නව මුහුණු වරක් ගෙන ඇත. වෙනත් විහාරවල චිත්‍ර බුද්ධ චරිතයටම සම්බන්ධ වුවද මේ චිත්‍රවලින් විදහා දැක්වෙන්නේ සිංහල ජාතියේ උපතේ සිට මහනුවර යුගය දක්වා ජාතික හා ආගමික සිද්ධීන් ය.

කැළණිය සම්බන්ධ පූජණීය දිනය වෙසක් පුන් පොහෝ දින වුවද දුරුතු මාසයේ කැළණි මහපෙරහැර පැවැත්වේ. මෙය දෙවැනි වන්නේ මහනුවර සුප්‍රකට දළදා පෙරහැරට පමණ ය.

♦ විස්කම් සෙනෙවිරත්න යක්කඩුව


Duke's Court Travel

Fly to Colombo

| | | |
|---|---|---|
| SriLankan | SriLankan Airlines | fr £300 + Taxes |
| QATAR AIRWAYS القطرية | Qatar Airways | fr £257 + Taxes |
| KUWAIT AIRWAYS | Kuwait Airways | fr £220 + Taxes |
| Emirates | Emirates | fr £480 + Taxes |
| ETIHAD AIRWAYS | Etihad Airways | fr £167 + Taxes |
| OMAN AIR | Oman Air | fr £200 + Taxes |
| JET AIRWAYS | Jet Airways | fr £165 + Taxes |

Note: All fares mentioned are low season / terms & conditions apply.

020 8748 3535

ATOL 3045 PROTECTED · AITO THE ASSOCIATION OF INDEPENDENT TOUR OPERATORS · IATA

204 King Street, London W6 0RA


## හැසිරෙන්නට නොදත් සිංහල බෞද්ධයා

ඊයේ දුරුතු පහළොස්වක පොහොය දිනයේ ශ්‍රීලංකාවේ රූපවාහිනී නාලිකාවන්හි නොයෙක් බෞද්ධාගමික වැඩ සටහන් සහ ධර්ම දේශනා වීය. ඒවා අතර ස්වර්ණවාහිනිය විසින් දඹදිව බුද්ධගයාවේ සිට ඉදිරිපත් කරන ලද වැඩ සටහන විශේෂ එකක් වූ බව කිව යුතුය.

එහිදී බුද්ධගයාවේ එහි විහාර කාර්‍ය්‍ය මණ්ඩලයට සම්බන්ධව කටයුතුකරන ශ්‍රීලංකාවෙන් ගොස් සිටින සිංහල භික්ෂූන් වහන්සේ නමක් එහි පැමිණෙන වන්දනා පිරිස් ගැන සඳහන් කරද්දී පෙන්නා දුන් කරුණක් ඉතා වැදගත්ය. ඒ මෙයයි. එනම් බුද්ධගයාව වැඳපුදා ගන්නට භික්ෂූන් වහන්සේලා ඇතුළු ගිහි වන්දනා කරුවෝ රාශියක් දිනපතාම පාහේ එහි යති. බුරුමය, තායිලන්තය, වියට්නාමය, ටිබෙට් රට, ජපානය ආදී දේශයන්ගෙන් එන අය ඉතා හික්මීමෙන් යුතුව, සන් සුන්ව, නිසි ආකාරයෙන් වැඳපුදා ගන්නා අතර, ශ්‍රීලංකාවෙන් පැමිණෙන සිංහල බෞද්ධ පිරිස් පමණක් නොහික්මුණු, පිළිවෙලක් නැති කලබලකාරී, අවිනීත ලෙසින් හැසිරෙන බවයි. කොටින්ම, පෝලිමක හැසිරෙන විදියවත් ඔවුන් දන්නේ නැතැයි ඒ හාමුදුරුවෝ කීහ.

බුද්ධ ශාසනය විනාශවිය නොදී රැකගන්නට නම් මේ දැඩිව සලකා බැලිය යුතු අංශයක් වෙයි. ශ්‍රීලංකාවේ අද දවසේ සිද්ධස්ථාන වලට යන සිංහල බෞද්ධ පිරිස්වල විනය විරෝධී හැසිරීම ප්‍රකටව පෙනේ. ශ්‍රීපාදස්ථානය පවා ඔවුන් සල කන්නේ විනෝද ගමනක් ලෙසටය.

1930 දී බ්‍රිතාන්‍ය ජාතික ප්‍රකට සිනමාකරු බැසිල් රයිට් ශ්‍රීලංකාව පිළිබඳ කළ සම්මානනීය කෙටි චිත්‍රපටයක් වෙයි එහි නම **Song of Ceylon** හෙවත් ලංකා ගීතය යි. එහි මූලික වශයෙන් දක්වන්නේ සිරිපා දය වැඳපුදා ගන්නට යන වන්දනාකරුවන් පිරිසකගේ භක්තිය හා සංවර හැසිරීමයි. ඒ අතීත සිංහළ බෞද්ධ හැසිරීම අද සම්පූර්ණයෙන්ම කණපිට හැරී ඇත.

අද ශ්‍රීපාදයට යන බොහොමයක් බෞද්ධ පිරිස් මත්පැන් බොමින් තුන් සරණේ වෙනුවට කැකෝගසා බයිලා කියමින් කෑම ගෙනියන කොළ හා අනෙක් කැළිකසල ඒ මේ අත විසිකරමින් ඒ පුදබිම අපවිත්‍රකරති. මෙම අශීලාචාර ගතිය පාලනය කරන්නට ආරක්ෂක මුරකාවල් යොදවන්නට අද රජයට සිදුව ඇත. මෙයින් වැටහෙන්නේ බුදු දහමෙන් සිංහළයා ඔළුවට ගත් දෙයක් නැති බවයි.

♦ ජනක පෙරේරා
Mt Lavinia Sri Lanka




ඔබේ මුදල් අදම යවන්න - අදම ලබාගන්න

අප මත විශ්වාසය තබා, ලංකාවට මුදල් යවනා අපගේ දහස් ගනන් ගණුදෙනුකරුවන් ඔවුන් දුක් මහන්සියෙන් උපයාගත් මුදල්, ක්‍ෂණිකව සහ සුරක්ෂිතව එතෙර සිටින තම ආදරණීයන් වෙත ලබා දෙන්නේ හද පිරි සතුටෙනි.

FAST CASH
SEND TODAY - COLLECT TODAY

* කොමර්ෂල්, හැටන් නැෂනල් සහ ලංකා බැංකු සමග එක්ව, දිවයින පුරා 500කට අධික ශාකා ජාලයකින් එදිනම මුදල් ලබාගැනීමේ පහසුව
* ලංකාවේ ඕනෑම බැංකු ගිණුමකට මුදල් ක්‍ෂණිකව බැර කිරීම
* ඔබගේ NRFC / RFC විදේශ ගිණුම් වලට මුදල් බැර කිරීම
* රටවල් 120කට මුදල් යැවීමේ පහසුව
* ඔබගේ මුදල් මැද පෙරදිග අතරමැදියන් වෙත නොයා ක්‍ෂණිකව හා සෘජුවම ගිණුමට බැර කිරීමේ විශ්වාසය

Transfer Fees From only £5

COMMERCIAL BANK · BOC BANK OF CEYLON · HNB · SEYLAN BANK LIMITED · NSB · HSBC · PEOPLE'S BANK · සම්පත් බැංකුව SampathBank · NDB bank · Standard Chartered · MCG Mike Cooke Group

www.efastcash.biz
020 8886 4488
Head Office: 125-127 Bramley Road, Oakwood, London, N14 4UT